| නාඩගම් | නූර්ති |
|---|---|
| (1) ලංකාවේ දකුණු දිග වෙරළබඩ ප්‍රදේශ වල නාඩගම් පැතිරී පැවතියේය. හලාවත, මීගමුව, කොළඹ ආදී ප්‍රදේශවල විශේෂයෙන් නාඩගම් ප්‍රචලිතව පැවතී ඇත. | (1) නූර්ති යන්න නෘත්‍ය යන වචනයෙන් බෙදී ව්‍යවහාරයට පත් වූ බව කියවේ. |
| (2) නාඩගම් ප්‍රභවය පිළිබඳ විවිධ මත ඇත. ඉන්දීය තෙරුක්කුත්තු වීථි නාට්‍ය අභාසය. මිෂනාරි ධර්ම ප්‍රචාරක අභාසය ලැබී ඇති බව කියවේ. | (2) 1877 බොම්බායේ සිට ලංකාවට පැමිණි බලිවාලා ප්‍රමුඛ පාර්සි නාට්‍ය කණ්ඩායමේ රංගයක් සෙල නූර්ති මෙරට ප්‍රචලිත විය. නාට්‍ය තේමා සමාජ දූර්වලන හා ජාතික හැඟීම් උත්පාදනය වන ලක්ෂණ වලින් යුක්තය. |
| (3) පිලිප්පු සිඤ්ඤෝ ගේ ඇහැලේපොල නාඩගම මුල්ම සිංහල නාඩගම ලෙස මතයක් පවතී. | (3) මුල්ම සිංහල නූර්ති රචකයා සී දොන් බස්තියන් වූ අතර ඔහු නිර්මානය කල රොලීනා මුල්ම සිංහල නූර්තිය වේ. |
| (4) අංග සම්පූර්ණ නාට්‍ය පිටපතක් තිබීම විශේෂ ලක්ෂණයකි. ද්‍රවිඩ වචන මිශ්‍ර භාෂාවක් භාවිත වේ. | (4) රචනා කළ පිටපතක් තිබීම මෙහිද විශේෂ ලක්ෂණයකි. |
| (5) නාඩගම් රඟ දක්වන ලද්දේ පස්ගොඩ කර තනන ලද අර්ධ කවාකාර කරලිය නම් රඟමඩලකය. | (5) රංග ශාලාවක් තුල පිංතූර රාමු වේදිකාවක නූර්ති රඟ දැක් වූ අතර මුදල් අය කොට ශාලාවක් තුල පෙන්වන ලද මුල්ම නාට්‍ය නූර්ති වේ. |



Scanned with CamScanner

| | |
|---|---|
| (6) ගීත හා සංගීත නිර්මාණය දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ තාල ආශ්‍රිතව සිදුකොට ඇත. මද්දලය, හොරණෑව, කයිතාලම, පටිතිස්සදය වාදන භාණ්ඩයි. | (6) උත්තර භාරතීය සංගීතය භාවිතා කරන ලදි. |
| (7) දින 3-7 අතර කාලයක් රාත්‍රියේ රඟ දක්වන ලදි. | (7) දර්ශනය පැය 03 කට සීමා විය. |
| (8) මෙහි පූර්ව රංගය නම් කොටසක් ඇති අතර සෙල්ලම් ලමා, බහු භූතයා, හඩ දූතයන් වැනි ස්ථාවර පාත්‍රයන් දකිය හැක. | (8) කවටයා චරිතය යොදගෙන ඇත. |
| (9) පොතේ ගුරු හා ගායක කණ්ඩායමක් ඇත. | (9) ජවනිකා සඳහා විචිත්‍රවත් පසුතල දර්ශන එනම් චිත්‍රවස්ත්‍ර භාවිතා කර ඇත. |
| (10) පිරිමි පමණක් රඟපාන ලදි. | (10) ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින් රඟ පෑම විශේෂයකි. මුලින්ම ස්ත්‍රීන් රඟපාන ලද්දේ නූර්ති වලය. |
| (11) ආලෝකය සඳහා කිට්සන් පහන් හා පන්දම් ආලෝකය භාවිතා කරන ලදි. අංග රචනය රංග වස්ත්‍ර භාවිතය සාමාන්‍ය මට්ටමක පවතින ලදි. | (11) වෙස් මෝස්තර හා රංග භූමි අලංකරණය රංග භාණ්ඩ ඉතා විචිත්‍රව යොදා ගැනීම. |
| (12) ඇහැලේපොළ, බැලසන්ත, බ්‍රැම්පෝඩ්, එච්ජින්, කාලගෝල, මනමේ ආදිය ප්‍රසිද්ධ නාඩගම් කීපයකි. | (12) ජනප්‍රිය නූර්ති රචකයා ජෝන් ද සිල්වා. ඔහු රාමායනය, සිරිසඟබෝ, දුටුගැමුණු, නලරාජ චරිතය, ශ්‍රී වික්‍රම රාජසිංහ ආදි නූර්ති නිර්මාණය කරන ලදි. චාල්ස් ඩයස් ද දක්ෂ නූර්ති රචකයෙකි. පද්මාවතී, නාගැනන්දය, කුසජාතකය ඔහුගේ නිර්මාණ වේ. ටවර් රඟහල නූර්ති සමග බිහුවූ ස්ථිර රඟහල වූ අතර චාල්ස් ඩයස්ගේ සියළු නූර්ති ටවර් රඟහලේ වේදිකා ගත විය. |

## නිපුනතාවය 5

### නරිබෑනා නාට්‍ය

Scanned with CamScanner

2. (i) උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාටකයක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෙම ගැමි නාටකයේ චරිත හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) මෙහි රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) සිංහල නාඩගම්කරුවන් දෙදෙනකු නම් කර ඔවුන්ගේ නාඩගම් නිර්මාණ දෙකක් පිළිවෙළින් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) නාඩගම් රඟ දැක්වූ රංගභූමිය ඇඳ නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) නාඩගම්හි රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) සමාරෝපය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාරෝපයෙහි ප්‍රභේද නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) එම අවස්ථාවට අවතීර්ණ වීම පිණිස රූපණ ශිල්පියකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 06 යි)

Scanned with CamScanner